# සිංහල බුද්ධාගම

ගණනාථ ඔබේසේකර මහතා ගැන ආණ්ඩුවේ පත්තර කඩමාල්ලට ලියූ බැලයා ඒ මහතාගේ කෘති කියවා ඇත්දැයි නො දනිමි. ඔහු ඒ මහතා ගැන වෙනත් අය ලියා ඇති දේ කිහිපයක් නම් කියවා ඇති බව ඔහුගේ හැල්ලෙන් පැහැදිලි ය. එහෙත් ඉන් කියැවෙන්නේ ඔහු ඔබේසේකර මහතාගේ කෘති කියවා ඇති බව නො වෙයි. පසුගිය දා දි අයිලන්ඩ් පුවත්පතෙහි ඔබේසේකර මහතා ගැන පළ වූ අතිරේකයෙහි ලිපි ලියූ අය අතර ගොම්බ්‍රිච් වැනි වයෝවෘද්ධ මහතුන් හැරුණු විට ඇමරිකාවේ විශ්ව විද්‍යාල කිහිපයක සහකාර මහාචාර්යවරු ද වූහ. ඇමරිකා එක්සත් ජනපදයෙහි සහකාර මහාචාර්යවරයෙක් යනු ලංකාවේ දෙවැනි ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුගේ  මට්ටමේ තැනැත්තෙක් වෙයි. බොහෝ විට එවැන්නකු ඊයේ පෙරේදා ආචාර්ය උපාධියක් ලත් අයකු විය හැකි ය. සමහරවිට ඒ අතිරේකය සඳහා ඇමරිකානු විශ්ව විද්‍යාලවලින් ලිපි එකතුකෙළේ යැයි සිතිය හැකි එච් එල් සෙනෙවිරත්න මහතා එතරම් ජ්‍යෙෂ්ඨ නොවන්නන්ගෙන් ලිපි එකතුකලා විය හැකි ය.

ඒ කෙසේ වෙතත් අපට ඇත්තේ ඔබේසේකර මහතාගේ සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රශ්නයක් ය. ඔහුගේ සමාජ විද්‍යාව ඔබේ සමාජ විද්‍යාව ලෙස හැඳින්වීමි. මෙහි ඔබේ යන්නට ඉංගිරිසි තේරුමක් ද වෙයි. එහි අණ පිළිපදින යන අදහස වෙයි. ඔබේ සමාජ විද්‍යාව යනු එක් අතකින් ගත්කල බටහිරයන්ගේ අණ පිළිපදින සමාජ විද්‍යාවක් වෙයි. අද මෙරට පමණක් නොව ආසියාවේ අනෙක් රටවල හා අප්‍රිකාවේ ඇතැම් උගත්තු විලාසිතාවකට බටහිර දැනුම විවේචනය කරති. ඔබේ සමාජ විද්‍යාවෙහි ද ඇතැම් තැනක බටහිර දැනුම විවේචනය කෙරෙනු දක්නට හැකි ය. එහෙත් මේ විවේචන ද ඉදිරිපත්වන්නේ බටහිර ආකෘතිය තුළම ය.

බටහිර දැනුම ගැන විවේචනයක් කළ ඩෙරීඩා මහතා බටහිර නොවන දැනුමක් නිර්මානය කෙළේ ද? සත්තකින් ම නැත. ඔහු බටහිර දැනුම විවේචනය කෙළේ ද බටහිර ආකෘතිය තුළ හිඳිමින් ය. මෙරට ඉන්නා තුට්ටු දෙකේ සාහිත්‍යකරුවකු හා විචාරකයකු මෙහි දී ඉලිප්පී කියනු ඇත්තේ පෙරදිග අපරදිග යනුවෙන් ද්විමය විරුද්ධතා (බයිනරි ඔපසිෂන්ස්) ඇසුරෙන් දැනුම වර්ගකිරීම (මොවුන් මෙය ලියන්නේ වර්ගීකරණය කිරීම ලෙස ය. එක් අනුකාරකයකු නම්කිරීම යන්න නාමකරණය කිරීම යනුවෙන් ලියා තිබෙනු දුටුවෙමි) වැරදි බව ය. මොහු දන්නා බයිනරිය කුමක් ද? ජීව විද්‍යාවේ පිරිමි ගැහැණු යනුවෙන් ද්විමය විරුද්ධතාවක් නැත් ද? ද්‍රව්‍යවාදී විඥානවාදී යනුවෙන් විරුද්ධතා නැත් ද? ඉර නැගීම හා ඉර බැසීම යනුවෙන් බයිනරියක් නැත් ද? ජීවත්වීම හා මියයෑම යනු එකක් ද දෙකක් ද? ඩෙරීඩා තවමත් ජීවත්වන්නේ ද? නැත්නම් මියගොස් ද? එසේත් නැත්නම් ඔහු ක්වොන්ටම් භෞතිකයේ ෂ්‍රෑඩිංගර් විද්වතා වරද්දාගත් තැනක වූ බළලා මෙන් ද? පශ්චාත්නූතනත්වය හා නූතනත්වය බයිනරියක් ද? මේවා බයිනරි කෙසේ වෙතත් බයි නරිවාදන් නම් වෙයි.

ඔබේ සමාජ විද්‍යාව ගැන ලියන අතර ඩෙරීඩාගේ විකාර බයි නරිවාදන් ගැන ද ලිවීමට අවශ්‍ය වනුයේ බටහිර දැනුම විවේචනය කළ බටහිරයන් අතර ඔහු ප්‍රධානියකු වූ (බයිනරියේ මියගොස් යන අන්තය සලකමින්) බැවින් ය. ඔහුට ද්විමය විරුද්ධතාවෙහි ඇති යම් ගැටළු පිළිබඳ අවබෝධයක් තිබුණ ද ඉන් ගොඩ එන මගක් ඔහු කියා නැත. ඒ වෙනුවට ඔහුට සිදුවූයේ ද්විමය විරුද්ධතා නමැති පඹගාලෙහි පැටලීමට ය. ලෝකයෙහි ජීවත්වන අපට ද්විමය විරුද්ධතා නැතිව භාෂාවක් නිර්මානයකරගත නො හැකි ය. මා යැයි කීවිට අනෙක් යන සංකල්පය ද එයි. එහෙත් ඉන් හැඟෙන්නේ බටහිර ඊනියා පශ්චාත්නූතනවාදීන් (ලංකාවේ පශ්චාත්නූතනවාදීහු නො වෙති. මෙහි ඇත්තේ බටහිරයන්ගේ පොත් කිහිපයක් කියවූ අනුකාරකයන් අතළොස්සකි.) කියන ආකාරයට අනෙකා විසින් මා නිර්මාණය කෙරෙන බවක් නො වෙයි. ද්විමය විරුද්ධතා නොමැතිව භාෂාවක් නොව පූර්ව භාෂා අවධියෙහි සංකල්පවත් නිර්මානයකිරීමට නො හැකි ය. භාෂාවෙන් අප යම් ආකාරයකට හසුරුවන්නාක් මෙන් අපි ද භාෂාව හසුරුවමු. අපි භාෂාව වෙනස්කරමු. කසිකබල් පශ්චාත්නූතනවාදීන් මිනිසා භාෂා නිර්මිතයක් යැයි කියන විට ඔවුන්ට භාෂාව මිනිස් නිර්මිතයක් ය යන්න අමතක වෙයි. එයට හේතුව ඔවුන් මොන බයි නරිවාදන් කීවත්  ක්‍රියාකිරීමේ දී ඊනියා බයිනරියේ එක් අන්තයක් පමණක් අල්ලාගැනීම ය.  මේ ද්විමය විරුද්ධතා අවශ්‍ය කොතැන ද, අනවශ්‍ය කොතැන ද, එවා ඉවත්කළ යුතු තැන ඉවත්කරන්නේ කෙසේ ද ආදිය දැනගැනීම සඳහා චතුස්කෝටික තර්කය හැදෑරිය යුතු ය. චතුස්කෝටිකය බටහිර නැත. එබැවින් ඩෙරීඩාට ද්විමය විරුද්ධයන්ගෙන් ගොඩ ඒමට නො හැකිවිය. ඔහුට කළහැකි

© Prof. Nalin De Silva

වූයේ ද්විමය විරුද්ධ ගැන විවේචනයක් කිරීම පමණක් ය. එය ද ඔහු කෙළේ ද්විවිමය විරුද්ධ පමණක් සලකමින් ය. වෙනත් වචනවලින් කියන්නේ නම් ඔහු ද්විකෝටික න්‍යායෙහි ගෙලවටක් එරී සිටියේ ය.

ඩෙරීඩා එසේ නම් අනෙක් බොහෝ අනුකාරකයන් ගැන කතාකිරීමට දෙයක් නැත. ඔබේසේකර මහතා ද තවත් අය ද ඉඳහිට යුරෝකේන්ද්‍රවාදයක් ගැන කතාකරනු දැකිය හැකි ය. එහෙත් මේ යුරෝකේන්ද්‍රික දැනුම යනු කුමක් ද? යුරෝකේන්ද්‍රික දැනුම යන සංකල්පය නිර්මානය වූයේ ආසියාවේ ද? නැත්නම් අප්‍රිකාවේ ද? නැත, එය ද බිහිවූයේ යුරෝපයෙහිම ය. බටහිර ඇතැම් ඊනියා රැඩිකල් බුද්ධිමතුන් අතින් ඒ බිහිවිණි. අවාසනාවකට යුරෝකේන්ද්‍රික දැනුම පිළිබඳ සංකල්පය ද යුරෝකේන්ද්‍රික වෙයි. යුරෝකේන්ද්‍රික දැනුමක් ගැන කතාකරන අනුකාරකයන් එයට විරුද්ධව නිර්මානයකළ වෙනත් දැනුමක් වෙයි ද? යුරෝකේන්ද්‍රික දැනුමෙහි පදනම ගැන මේ අනුකාරකයන් අධ්‍යයනය කර තිබේ ද? අප පසුගිය අවුරුදු විස්සකට ආසන්න කාලයක් තිස්සේ මේ පදනම සාකච්ඡා කර ඇත. එහි දී අප යොදාගන්නා ප්‍රධානම සංකල්පය චින්තනය යන්න ය. අනුකාරකයන්ට චින්තනය යන සංකල්පය නො තේරෙයි. ඔවුන් සිතන්නේ ඒ ජාතිවාදී සංකල්පයක් කියා ය.

දැන් අපි නැවතත් ඔබේ සමාජවිද්‍යාව දෙසට හැරෙමු. ඔබේ සමාජවිද්‍යාවෙහි ඇත්තේ මුළුමනින් ම බටහිර සංකල්ප ය. අපි ප්‍රධාන වශයෙන් ම සිංහල බුද්ධාගම ගැන කතාකරමු. ඔබේසේකර මහතා බුඩිස්ම් ට්‍රාන්ස්ෆෝර්ම්ඩ් කෘතියෙහි ද වෙනත් ලිපිවලද මේ ප්‍රශ්නය කතාකරයි. ඔහු විස්තර කරන්නේ සිංහලයන්ගේ බුද්ධාගම නොව සිංහල සමාජයේ විවිධ ස්ථරවල ඇති සංස්කෘතික ලක්ෂණ කිහිපයක් ය. ඔහුට අවශ්‍ය වී ඇත්තේ බටහිරයන් සමහරකු සතුටුකරන විස්තර බටහිර ඇසින් උඩින් පල්ලෙන් කීම බව පැහැදිලි ය. ඇතැමකුට පෙනී යනු ඇත්තේ ඔහු විස්තරාත්මක කෘති රචනාකර ඇති බව ය. එහි විස්තර අඩංගු ය. එහෙත් එහි ඇත්තේ එක් කරුණක් හෝ දෙකක් ගැන විවිධ පැතිවලින් බලා කෙරෙන විස්තරයක් නොව කරුණු රාශියක් ගැන එකම පැත්තෙන් බලා කෙරෙන විස්තර රාශියකි. ඒ නිසා ම ඒ විස්තර අතර සංගතභාවයක් දක්නට නො ලැබෙයි.

බුඩිසම් ට්‍රාන්ස්ෆෝර්ම්ඩ් කෘතියෙහි ලංකාවේ බුද්ධාගම වෙනස් වී ඇති ආකාරය ගැන විස්තරයක් ඇතැයි කියැවෙයි. එහෙත් පළමුකොටම අසන්නට ඇත්තේ මේ වෙනස්වීම කෙරෙන්නේ කුමකට සාපේක්ෂව ද යන්න ය. පසුගිය සියවසේ ලංකාවේ බුද්ධාගම පරිණාමය වී ඇති බව පෙන්වීම සඳහා මුලින්ම කළයුත්තේ අතීතයේ ලංකාවේ බුදු සසුන මේ යැයි විස්තරකිරීම ය. එසේ නැතිව අප වෙනස්වීමක් දකින්නේ කෙසේ ද? කොතැනක ද? ඔබේසේකර මහතා මේ මූලික අවශ්‍යතාව නොසළකා හරියි. එය ඇතැම්විට හිතාමාතාම කළ එකක් වීමට ද බැරි නැත. එයට හේතුව අවුරුදු සියගණනක් තුළ ලංකාවේ බුද්ධ ශාසනය එතරම් වෙනස්වී නොමැති වීම ය.

බුද්ධාගම යන්න සංකල්පයක් වශයෙන් නම් බටහිරයන් අපට දුන් දෙයක් බව පැහැදිලි ය. එහෙත් ඉන් කියැවෙන්නේ ඉන් පෙර මෙරට අද බුද්ධාගම නමින් හැඳින්වෙන දෑ නොතිබුණි ය යන්න නො වෙයි. මෙරටට මිහිඳු හිමියන් වැඩමකර නොබෝ කලකින් බුදු සසුන පිහිටුවනු ලැබිණි. ඉන් පෙර ද මෙරට තෙරුවන් සරණ ගිය උපාසක උපාසිකාවන් සිටි බව මහාවංශයෙන් හා වෙනත් මූලාශ්‍රවලින් සනාථ වෙයි. මිහිඳු හිමියන්ගේ කාර්යභාරය වූයේ මෙරටට බුදු දහම හඳුන්වාදීම නොව මෙරට බුදු සසුන පිහිටුවීම ය. ඒ බුදු සසුන සිංහල බුදු සසුන විය. සසුන යනු ඔබේසේකර මහතා හා ගොම්බ්‍රිච් මහතා කියන ආකාරයට ඉගැන්වීම (ටීචින්)  නො වෙයි. ඔවුන්ට සසුන ටීචින් වූයේ කිනම් චීටින් (රැවටීම) ක්‍රමයකට දැයි නො දනිමි. මිහිඳු හිමියන් පිහිට වූ සිංහල බුදු සසුන අශෝක බුදු සසුනෙන් වෙනස් විය. සිංහල බුදු සසුනෙහි බෝධීන් වහන්සේ ප්‍රධාන ම සංකේතය විය. අද පවත්වන බෝධි පූජාවල ආරම්භය ඇත්තේ පාණදුරේ අරියධම්ම හිමියන්ගේ බෝධි පූජාවල නො වෙයි. එදා සඟමිත් මෙහෙණින් වහන්සේ සමග බෝධීන් වහන්සේගේ විවිධ කටයුතු සඳහා විශේෂ පිරිසක් දඹදිවෙන් පැමිණි බව වංශකතාවල සඳහන් වෙයි. ඔබේසේකර මහතා කළයුතුව තිබුණේ මේ සිංහල බුදු සසුන වෙනස් වී ඇති ආකාරය තේරුම් ගැනීම ය. එහෙත් එය බටහිර ක්‍රිස්තියානි සංකල්ප ඔස්සේ තේරුම් ගතහැක්කක් නො වෙයි. එබැවින් දෝ ඔහු දහනවවැනි සියවසේ අගභාගයට තම ඊනියා අධ්‍යයනය ලඝුකරයි. එහෙත් ඒ කෙටිකාලය තුළ වුව ද ඔහු කරන විස්තරය අසංගත ය. දහම, ආගම, සසුන, සිංහල බුදු සසුනෙහි දේව සංකල්පය ආදිය ගැන ඔහු දක්වන මත පරස්පරවලින් ගහණ ය.

(මතු සම්බන්ධයි)

© Prof. Nalin De Silva